*Sarka* was in meditation, *Mathali*, his driver takes Kamala and her mother to the heaven and shows its splendor. This is the story that the short story *Mathalige Vihiluvak* is based on.

If V. D. de *Lanarolle*'s stories are considered to be the Sinhala short stories written before *Wickramasinghe*'s era, it is felt that there is no fault to introduce these stories as more advanced stories than *Wickramasinghe*'s stories such as *Abhirahasa.*

**End Notes:**

1 These short stories were written by me to the newspaper *Dinamina* before 39 years in 1923 – Preface – *Alaya M. D. Gunasena* and Company – printed in 1962.
2 This short story collection is included nine short stories. 1. *Upasaka mahaththaya 2. Navakathawak 3. Murandu Lamissi 4. Kivindage Birinda 5. Thoppiya 6. Alaya 7. Mathalige Vihiluvak 8. Chandra Vimanaya 9. Hathara Riyana.*
3 Preface.
4 Preface.
5 I have not learnt writing short stories as an art. In that time, there were no books to learn it as an art. So, I do not know whether the name short stories is suitable for these stories. – Preface.
6 **A.**, p. 12.
7 **A.**, p. 15.
8 **A.**, p. 17.
9 Too much courtesy too much crafty.
10 **A.**, p. 9.
11 **A.**, p. 9.
12 **A.**, p. 12.
13 **A.**, p. 18.
14 **A.**, p. 37.
15 **A.**, p. 40.
16 **A.**, p. 42.
17 **A.**, p. 40.
18 **A.**, p. 61.
19 **A.**, p. 62.
20 **A.**, p. 64.

# කාන්තාවන් කේන්ද්‍රීය ජනක්‍රීඩාවන්හි සමාජ හා මානව විද්‍යාත්මක වටිනාකම

## (කාන්තාවන්ට ආවේණික සිංහල ජනක්‍රීඩා කිහිපයක් ආශ්‍රයෙන් සිදු කෙරෙන විමර්ශනයකි)

**ස්වර්ණා ඉහළගම**

Sri Lankan society is heir to a rich legacy of traditional folk plays that depict a significant part of Sri Lankan culture. Primarily these short stories can be divided as indoor plays and outdoor plays and in generally the outdoor plays were practiced by men and indoor plays by women. The objective of this paper is to identify the role of women in Sinhalese traditional folk plays by reviewing some selected women related folk plays. The major findings of this paper are; (a) such plays were not only plays aimed at entertainment but also they were aimed at important purposes like getting much needed rains for agriculture, receiving blessings from the God and gaining protection from dangerous infectious diseases, (b) they have served immensely to train the art of cohabitation to the villagers and to inculcate the village people on the quality or value of maintaining unity in achieving common success, (c) traditional Sinhala village life was a peaceful and harmonious one which rarely had any internal disparity or conflict due to folk plays practices and, (d) the humanitarian nature of suchplays was a result of Buddhism, and the disciplinarian lifestyle.

### මානව පරිණාමය හා ක්‍රීඩාව

මානවවිද්‍යාඥයින්ගේ සොයා ගැනීම් අනුව මානව පරිණාමය සිදුවන්නේ ප්ලයිස්ටොසීන (Pleistocene) යුගයේ (නෙස්තුර්හ්, 1981: 71) දී ය. මානවයා, කණ්ඩායම් වශයෙන් සැරිසැරූ

© **ආචාර්ය ස්වර්ණා ඉහළගම**
සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

අනෙකුත් සත්ත්ව කොට්ඨාස අතුරින් වෙනත් ලක්ෂණ ප්‍රදර්ශනය කළේ මෙකී යුගයේ දී ස්වකීය වාසස්ථාන උදෙසා ගල්ගුහා සකස් කර ගැනීමේ ක්‍රියාවලියත් සමඟ ය. මීට සමගාමී ව ගල් ආයුධ නිපදවා ගැනීම, විවිධ ස්වරූපයේ දඩයම් ක්‍රම අත්හදා බැලීම හා පරිකල්පන ශක්තිය වර්ධනය වීම හේතුවෙන් ඔව්හු අනෙකුත් සත්ත්ව කොට්ඨාසවල චර්යාවෙන් තමන් වෙන් කෙරෙන නිර්මිතය වූ සංස්කෘතිය ද ක්‍රමක්‍රමයෙන් ගොඩනගා ගත්හ. ක්‍රීඩාව යනු සමාරම්භක යුගයේ පටන් ම ගොඩනැගුණු මානව ක්‍රියාකාරකම් සමූහයක ප්‍රතිඵලයකි. මිනිසාගේ සමස්ත භාවමය හා ද්‍රව්‍යමය නිර්මාණ, සංස්කෘතියට අයත් වන හෙයින් ක්‍රීඩාව ද සංස්කෘතියට අයත් ප්‍රමුඛාංගයක් වශයෙන් හැඳින්වීමේ හැකියාව පවතී. ආහාරයත් ජලයත් මානව පැවැත්ම විෂයෙහි බලපාන අනිවාර්ය සංරචකද්වයයක් වන හෙයින් සත්ත්වයින් පසුපස හඹායමින් ඔවුන් ග්‍රහණය කර මරාගෙන අනුභව කිරීමේ ක්‍රියාවලිය ක්‍රීඩාවේ සමුද්භවය කෙරෙහි බලපාන්නට ඇත. පෙර-අපර දෙදිග සෑම ශිෂ්ටාචාරයක ම පාහේ දඩයම ක්‍රීඩාවක් බවට පත්ව ඇති ආකාරය තහවුරු කෙරෙන සාක්ෂ්‍යයෝ වෙත්. ජලය සොයාගෙන යාමේ දී හමු වූ ස්වාභාවික ජලාශවලින් ජලය පානය කිරීම, අත්පා වෙහෙසවමින් ජලය ඉසීමට තැත් කිරීම වැනි ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් එය ද ක්‍රීඩාවක් බවට පත්වන්නට ඇත.

## ලාංකේය ක්‍රීඩාවෙහි ඓතිහාසිකත්වය

පණ්ඩුකාභය රජු නැකැත්කෙළි දින චිත්තරාජ යක්ෂයා සමඟ සමඅසුන් ගෙන දෙව් මිනිස් නැටුම් කරවමින් රතික්‍රීඩාවෙන් යුක්තව තුටුපහටු විය (මහාවංශය- ප්‍රථමභාගය 1928 ඃ 46) යන **මහාවංශ** සඳහනට අනුව නැකැත් ක්‍රීඩාව හා රතික්‍රීඩාව වශයෙන් මෙරට ක්‍රීඩා විශේෂද්වයක් වූ බව හඳුනාගත හැකි ය. මෙරටට වැඩම කළ බුදුරජාණන් වහන්සේ විසින් ගිරිදිවයිනට පලවා හැරුණු යක්ෂයෝ ඉතා සතුටින් යුක්තව නැකැත් උත්සව පැවැත්වූහ'යි (සිංහලානුවාද සහිත දීපවංශය 1970 ඃ 120) යන සඳහනත් රජතුමාගේ අණ පරිදි සත්දිනක් පුරා පැවැත් වූ බව කියැවෙන නැකැත් කෙළිය අතිශය විනෝදාත්මකවූ ද අනාචාරයට පවා තුඩු දෙන්නාවූ ද සැණකෙළියකැයි (ආරියපාල 1962 ඃ 345) දැක්වෙන සඳහනත් අනුව පූර්වෝක්ත ක්‍රීඩාවන් මෙරට ස්ථාපනය වී තිබූ ආකාරය වඩාත්



තහවුරු වේ. මීට අමතරව පණ්ඩුකාභය රජතුමා චිත්තරාජ යක්ෂයාට වාසය කිරීමට අභයවැවෙහි යට භාගය සකස්කර දුන් බව පැවසේ. එමෙන් ම ඔහු තැණවූ වැව ජයවැව යන විශේෂ නාමයෙන් හඳුන්වන්නට ඇත්තේ ද විශේෂ ජයග්‍රහණ ලැබූ අවස්ථාවන්හි ඒවා සමරමින් ජලස්නානය කිරීම හේතුවෙන් (මහාවංශය - ප්‍රථම භාගය, 1928, 46) බව ද සඳහන් වේ. පූර්වෝක්ත සාක්ෂ්‍ය අනුව නැකැත් ක්‍රීඩාවට අමතරව ජලක්‍රීඩාව ද මෙරට මුල් ම යුගයේ පැවති බව තහවුරු වේ. මෙකී ක්‍රීඩා විශේෂද්වයයම පණ්ඩුකාභය රජතුමාගෙන් පසුව ද පැවත ආ බවට සාක්ෂ්‍ය වේ; දෙවනපෑතිස් රජතුමා රටවැසියනට දිය කෙළි විධාන කොට තෙමේ දඩකෙළියට ගියේය; දුටුගැමුණු රාජාභිෂේකයෙන් පසුව දිවාභාගයෙහි තිසාවැවේ ජලක්‍රීඩා කළේය, ඔහු (දුටුගැමුණු) කසාගලින් ඔබ කඳවුරු පිහිටුවා පොසොන් මසෙහි ප්‍රද්‍යෝත නම් වැව කරවා එහි දිය කෙළියෙහි යෙදුණේය(මහාවංශය - ප්‍රථම භාගය, 1928ඃ 54; 109; 105). පූර්වෝක්ත ඓතිහාසික මූලාශ්‍රයගත සාක්ෂ්‍යවලට අමතරව **මුවදෙව්දාවත**, **කව්සිළුමිණ** වැනි සම්භාව්‍ය පද්‍ය සාහිත්‍ය කෘතිවල ද කෝට්ටේ යුගයේ හා ඉන් පසුව රචනා වූ සෑම සංදේශ කාව්‍යයකම පාහේ ද ජලක්‍රීඩා පිළිබඳ තොරතුරු සඳහන් වීමෙන් එය සාමාන්‍ය ජනයා අතර පවා ප්‍රචලිත වූ ක්‍රීඩාවක් බව තහවුරු වේ. මේ ආකාරයට ආරම්භ වී ව්‍යාප්ත වූ සිංහල ජනක්‍රීඩා සියුම්ව නිරීක්ෂණය කරන කල ඒවා විනෝදාස්වාදය, ආගමික අරමුණු හා සාමූහික ක්‍රියාකාරකම් පදනම් කරගෙන බිහි වී ඇති බව හඳුනාගත හැකිය. ''ඔවුන්ට ක්‍රීඩා වර්ග ඇත්තේ ස්වල්පයකි. කෙළිදෙලෙන් කල් යැවීමට ද කලාතුරකින් සිදුවන බැවිනි'' (නොක්ස්, 2008 ඃ 281). යන්න ලාංකේය ජනක්‍රීඩා පිළිබඳ ඉදිරිපත්ව ඇති සාවද්‍ය මතයකි. අංගංපොර, කඩුහරඹ, ලී හරඹ, මුෂ්ටි යුද්ධ, මුගුරු හටන, පැනුම් පිනුම්, අංකෙළිය, පොල් කෙළිය, ලී කෙළිය, නයි නැටවීම, පන්දු කෙළිය, ඉරටු හැංගීම, අතුරුමිතුරු යනාදී වශයෙන් පවතින ක්‍රීඩා සමුච්චය මගින් ඒ බව තහවුරු වේ. මෙකී ක්‍රීඩා පවත්වන ස්ථාන අනුව එළිමහන් හා ගෘහස්ථ ක්‍රීඩා වශයෙන් ද ක්‍රීඩාවෙහි ස්වභාවය අනුව ත්‍රාසජනක, හාස්‍යජනක හා විනෝදජනක වශයෙන් ද ක්‍රීඩාවෙහි අරමුණු අනුව ආගමික හා පොදු ක්‍රීඩා වශයෙන් ද ක්‍රීඩාව කේන්ද්‍රීය පුද්ගලයන් අනුව ළමා, පුරුෂ හා ස්ත්‍රී වශයෙන් ද වර්ග කළ හැකිය. මේ ක්‍රීඩාවන් අතුරින් මෙම ලිපියේ දී අවධානය යොමු කෙරෙන්නේ කාන්තාවන් උදෙසා වෙන් වී පැවති ජනක්‍රීඩා පිළිබඳව ය.

## කාන්තාවන් කේන්ද්‍රීය ජනක්‍රීඩා

මානව ශිෂ්ටාචාරය ක්‍රමක්‍රමයෙන් වර්ධනය වෙත් ම දෛනික ජීවිතයේ දී මෙන් ම සමාජ ජීවිතයේ දී ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට පැවරෙන කාර්යයන් ශරීර ශක්තිය හා ආගමික මෙන් ම සමාජ ව්‍යුහය වැනි හේතූන් මත බෙදා වෙන් කර ගෙන තිබෙනු හඳුනාගත හැකිය. මේ ලක්ෂණය සාම්ප්‍රදායික සිංහල සංස්කෘතියෙහි ද දක්නට ලැබේ. නිවසින් බැහැරව හේනේ, කුඹුරේ, පතලේ හෝ වෙනත් ස්ථානයක හෝ ශ්‍රමය වැය කෙරෙන කාර්යයන් නිරන්තරයෙන් ම පුරුෂ පක්ෂයට පැවරිණි. සාම්ප්‍රදායික සිංහල සමාජයෙහි විවාහපත් යුවළකගේ මූලික අපේක්ෂාවන් අතරට පුතකු ලැබීම ඇතුළත් වූයේ ද මෙම තත්ත්වය මතය. සැමියාට අවශ්‍ය ආහාරපාන කලට වේලාවට පිළියෙල කරදීම, මලු පැදුරු වැනි නිවසට අත්‍යවශ්‍ය මෙවලම් නිර්මාණය කිරීම මෙන් ම ''වී කෙටීම හා දරදිය ඇදීම'' (නොක්ස්, 2008 : 260) හා දරුමල්ලන් හදා ගැනීම ස්ත්‍රීන්ගේ දෛනික කාර්යයන් අතර ප්‍රමුඛ විය. මෙරට සාම්ප්‍රදායික ජනක්‍රීඩා ද මෙම තත්ත්වයට සමගාමීව ස්ත්‍රීන් හා පුරුෂයන් අතරේ වෙන් වෙන් ව බෙදී පැවතුණි. නිර්භීතභාවය, අවදානම් අවස්ථාවන්ට මුහුණදීමේ හැකියාව හා කායික හා මානසික ස්වස්ථතාව පදනම් කරගෙන පොල්කෙළිය, අං කෙළිය, කතුරු ඔන්චිල්ලා පැදීම, අංගම් පොර, කඩු ශිල්පය, දුනු ශිල්පය හා හස්ති ශිල්පය යනාදී ක්‍රීඩාවන්හි යෙදීමට පුරුෂ පක්ෂයටත් ඔළිඳ කෙළිය, ලී කෙළිය, ඔංචිලි පැදීම, පංචකෙළිය, දිය කෙළිය වැනි ක්‍රීඩාවන්හි යෙදීමට කාන්තා පක්ෂයටත් අවකාශ සැලසිණි.

## ඔළිඳ කෙළිය

''කොයි අන්දමකින් හෝ වෙහෙසීම අරුචිකර දෙයක් බවට පත් කරන දේශගුණයක වෙසෙන සිංහලයා, අනිත් නිවර්තන දේශගුණික ප්‍රදේශයන්හි වෙසෙන අයවලුන් මෙන් ම, ව්‍යායාමය සඳහා ම ව්‍යායාම ගන්නේ ඉතාමත් මඳ වශයෙනි. එබැවින් මොවුන්ගේ ක්‍රීඩාවන් සන්සුන්, උනන්දුකර නොවූ ඒවා වීම පුදුමයට කරුණක් නොවේ. (Journal of Royal Asiatic Society - Ceylon Branch 1873: 1) යනුවෙන් ලුඩොවිසි විසින් සිංහල ක්‍රීඩා පිළිබඳ ව ඉදිරිපත් කරනු ලැබ තිබෙන සඳහන සියලු ම ක්‍රීඩාවන් සම්බන්ධයෙන් ගළපාලිය නොහැකි වුව ද කාන්තාවන්ට ආවේණික ලාංකේය ජනක්‍රීඩා සම්බන්ධයෙන් එම ප්‍රකාශයෙහි ඇතුළත් 'සන්සුන් ක්‍රීඩාවන්'



යන යෙදුම ගළපාලිය හැකි ය. ඉතා සන්සුන් ඇවතුම්-පැවතුම්වලින් යුක්තව, ප්‍රභූ පවුල්වල මෙන් ම සාමාන්‍ය පවුල්වල කාන්තාවන් ද නියැලුණු ඔළිඳ කෙළිය, ගෘහස්ථ ජනක්‍රීඩාවකි. මෙම ක්‍රීඩා සඳහා යොදා ගැනෙන්නේ ශ්‍රී ලංකාවේ බහුලව වැවෙන ඔළිඳ වැලෙන් ලබා ගන්නා කලු පැහැති ලපයක් සහිත දැඩි රක්ත වර්ණයෙන් යුක්ත වූ අලංකාර ඇට විශේෂයකි.'' ඈත අතීතයේ සිට ම පෙරදිග ජනයා අතර ඇටවර්ගවලින් ක්‍රීඩා කිරීමේ සම්ප්‍රදායක් පැවතිණි (ඇම්. බී. ආරියපාල උපහාර අංකය, වර්ෂය නොදැක්වේ : 81). පූර්වෝක්ත පෙරදිග සම්ප්‍රදාය අනුව ඔළිඳ කෙළිය ඇට වර්ගයක් යොදා ගනිමින් බක්මාසයේ දී කාන්තාවන් දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදු කෙරුණු ක්‍රීඩාවක් බව,

''මෙදා අපට ගිය අවුරුදු     කෝණේ
සදා ඔළිඳ කෙළිමුව     අසමානේ''

''නෙතේ බැල්ම තොර නැතුව     බලන්නේ
දෙන්න දෙපිළ ඉඳ ඔළිඳ     කෙළින්නේ''

(සිංහල ජනසම්මත කාව්‍ය 2011: 23, 22)

යන පද්‍යවලින් සනාථ වේ.

''ගෙවලත් පළමුව ගොම මැටි     ගාපූ
නොයෙකුත් අය ඉසකණ     සෝදාපූ
වන මුත් රට පට පිරුවට     ඇඳපූ
සඳුනුත් පිනිදිය තෙල් ගෙන     ගාපූ''

(සිංහල ජනසම්මත කාව්‍ය 2011: 23)

පූර්වෝක්ත පද්‍යයෙන් පැවසෙන පරිදි ඔළිඳ කෙළිය ඇරඹීමට පෙර නිවෙස පවා ගොම මැටි ගා ශුද්ධ පවිත්‍ර කෙරේ. ක්‍රීඩාවේ යෙදෙන කාන්තාවෝ ද ඒ සඳහා පේවිය යුත්තාහ. මෙම කරුණු අනුවත්,

''උපුල් සුරිඳු සිහි කර ගෙන     සරියේ
විපුල් ඔළිඳ කෙළියට අප     ඇරියේ

(සිංහල ජනසම්මත කාව්‍ය 2011: 24)

යන පද්‍යයට අනුවත් ඔළිඳ කෙළිය, කිසියම් ආගමික පරමාර්ථයකින් සිදු කරන ලද්දකැයි සිතිය හැකිය. ඔළිඳ ක්‍රීඩාව සඳහා යොදා ගැනෙන

මෙවලම හැඳින්වෙන්නේ 'ඔළිඳ පෝරුව' නමිනි. උඩරට ඇතැම් ප්‍රභූ කාන්තාවන් මෙම ක්‍රීඩාව සඳහා ඔළිඳ ඇට වෙනුවට මුතු භාවිතයට ගත් බව ද පැවසේ. ඒ අනුව ඔළිඳ පෝරුව 'මුතු පෝරුව' නමින් ද හැඳින්වී තිබේ.

''හෙස් අය නොදනිති මගෙ මුතු පෝරුව
තිස් පැය පසුකර ගන්නය මාරුව''
(සිංහල ජනසම්මත කාව්‍ය 2011: 25)

'ඔළිඳ කෙළිය' නමින් සිංහල ජනසම්මත කාව්‍ය නමැති කෘතියෙහි ඇතුළත් පැදි පෙළට අනුව ඔළිඳ පෝරුවක එක් පැත්තක වළවල් හත බැගින් ඇත. දෙපැත්තේ ඇති එම වළවල් දාහතරට අමතරව ක්‍රීඩිකාවන් දිනාගත් ඔළිඳ ඇට දැමීමට දෙපැත්තෙහි හතරැස් වූ කොටු දෙකක් නිර්මාණය කර තිබේ. ඔළිඳ පෝරුවේ ඇති වළවල් දාහතරට ඔළිඳ ඇට හතර බැගින් වැටෙන සේ දැමීමෙන් ක්‍රීඩාව ආරම්භ වේ. ඔළිඳ 'පුරවනවා' යන විශේෂ නාමයෙන් හැඳින්වෙනුයේ ද මේ අවස්ථාවය. ඉන් අනතුරුව ක්‍රීඩිකාවෝ එක් වළක ඇති ඔළිඳ ඇට ඉවතට ගෙන අනෙක් වළවල්වලට දමමින් යති. ඊළඟ වළවල්වල ඔළිඳ ඇට සම්බන්ධයෙන් ද මේ ක්‍රියාව ම අනුගමනය කෙරේ. මේ ක්‍රියාවේ යෙදෙමින් සිටින අතරතුර අතේ ඇති ඔළිඳ ඇට අවසාන වනවාත් සමඟ ම ඇයට හිස් වළක් හමුවුවහොත් ඊට එහායින් ඇති වළේ තිබෙන ඔළිඳ ඇට සියල්ලම ඇය සතු වේ. එහෙත් පිළිවෙළින් හිස් වළවල් දෙකක් හමුවුවහොත් ප්‍රතිවිරුද්ධ ක්‍රීඩිකාවට අවස්ථාව හිමිවේ. මේ පටිපාටියට අනුව වැඩිම ඔළිඳ ඇට ප්‍රමාණයක් හිමිකර ගන්නා තැනැත්තිය ජයග්‍රාහිකාව බවට පත් වේ. ඔළිඳ ක්‍රීඩාව සඳහා පෝරුව සකස් කිරීමේ සිට ක්‍රීඩාවේ නියුක්ත වීම හා අවසානය දක්වා ඇති තදනුබද්ධ කාර්යයන් පිළිබඳ ව සියුම් ව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ මෙම ක්‍රීඩාව ඉවසීම, බුද්ධි වර්ධනය සහ විනෝදාස්වාදය කේන්ද්‍ර කරගත් ක්‍රීඩාවක් වශයෙන් සිංහල සංස්කෘතියට අනන්‍යතාවක් එකතු කර ඇති බවකි.

## මේවර කෙළිය

කාන්තාවන්ට ආවේණික ජනක්‍රීඩා අතර මේවර කෙළියට ද විශේෂ ස්ථානයක් හිමිවේ. 'මේවර' යන වචනයෙහි අර්ථය පිළිබඳව විවිධ මත පළවී තිබේ;



''මේවරයා යනු සේවකයා ය. මේවරය යන පදය උච්චාරණයේ පහසුව තකා මේවර ලෙස සකස් වී ඇතැයි නිගමනය කළ හැකිය. තම නිවසේ සිටින සේවකයකු නැතිවීමෙන් පසු අසල්වැසි යෙහෙළියන් අමතා ඔහු ගැන විමසන ස්වාමිදුවකගේත් පිළිතුරු දෙන යෙහෙළියන්ගේත් දෙබසක් පරිදි මේවර ගී සකස් වී ඇත (ගැමි ගීය 1968: 12). පූර්වෝක්ත මතයට අනුව මේවරයා යනු සේවකයෙකි. මේවර කෙළිය සිදුවන ආකාරය විමර්ශනය කිරීමේ දී මෙම අදහස සාවද්‍ය බව පැහැදිලි වේ. මේවර කෙළියෙහි පළමු පියවර වන්නේ අත්වැල් බැඳගත් කාන්තාවන් රවුමක ආකාරයෙන් සමූහගත වීමයි. ඒ අතුරින් එක් කාන්තාවක් වැලි යට වළල්ලක් සඟවා එය දකුණු පාදයෙන් වසාගෙන සිටියි. මේවර කෙළියට අදාළ ගී ගායනය සිදුවන්නේ වටේ යන අය හා මැද සිටින කාන්තාවන් අතර හටගැනෙන දෙබසක ආකාරයෙනි. ගායනය අවසානයේ දී වටේ යමින් සිටින කාන්තාවන් අතුරින් එක් අයෙක් 'ඔට්ටුයි' යනුවෙන් පවසයි. ඒ සමඟ ම පිරිස සඟවාගෙන සිටින වළල්ල ගැනීමට පොර බදති. වළල්ල සොයාගත් කානතාවෝ ජයග්‍රාහිකාවෝ වෙති.

මෙම ක්‍රීඩා පටිපාටියට අනුව මේවරයා යනු සේවකයා විය නොහැකිය. මේවර යන්නට ආභරණය යන අර්ථය ද (සෝරත හිමි, 1999: 797) ගළපාලිය හැකි බැවින් එය කාන්තාවන් පළඳින ආභරණයකැයි අර්ථ ගැන්වීම වඩාත් යෝග්‍යය. එකී ආභරණය ඇතැම් තැනක වළල්ලක් ලෙස ද තවත් තැනක කරාබුවක් ලෙස ද හඳුන්වන අවස්ථා ජනප්‍රවාදයේ පවතී. කන් විදීම සිංහල සංස්කෘතියෙහි පවතින කාන්තාවන් සම්බන්ධ ද්වාරකර්මවලින් එකක් වන හෙයින් මේවරය යනු කරාබුව ලෙස අර්ථගැන්වීම වඩාත් සුදුසු ය. කරාබුව ප්‍රමාණයෙන් කුඩා ආභරණයක් වන හෙයින් ක්‍රීඩාවේ දී ඊට වඩා ප්‍රමාණයෙන් විශාල ආභරණයක් වූ වළල්ල යොදා ගන්නට ඇත. මේවර සෙල්ලම නමින් වන පැදිපෙළට අනුව (සිංහල ජනසම්මත කාව්‍ය, 2011: 25) මෙකී ආභරණය අස්ථානගත වන්නේ කොස් කැඩීම, මුං කැඩීම, වී කෙටීම, පොල් ඇඹරීම, ජලස්නානය, ළිඳෙන් වතුර ඇදීම, අතුගෑම වැනි කාන්තාවනට ම විශේෂිත වූ කාර්යයක නියැලෙන අවස්ථාවේ දී ය. කාන්තාවන්ගේ සාමූහිකත්වය කේන්ද්‍ර කොට ගෙන සකස් වී තිබෙන මෙම ක්‍රීඩාව මගින් දෛනික කාර්යයන්හිදී තමාගේ මෙන් ම

තමා හැඳි-පැලඳි ආභරණ විෂයෙහිත් අවධානය යොමු විය යුතු බවට ඔවදනකුත් විනෝදාස්වාදයකුත් සැපයේ.

## ලී කෙළිය

ලී කෙළිය ක්‍රීඩාවක් වශයෙන් මෙන් ම ජනනැටුමක් වශයෙන් ද ප්‍රකට ය. සිංහල ජන සම්මත කාව්‍ය සංග්‍රහයෙහි 'නැටුම්කවි' යන ශීර්ෂය යටතේ (2011: 99) දැක්වෙන්නේ ලී කෙළි නැටුමට අදාළ කාව්‍ය පන්තියකි. එහිම 'පුරාණ ලී කෙළිකවි' සහ 'ලී කෙළි පුවත' (2011: 103-106; 106-108)යන ශීර්ෂ යටතේ දැක්වෙන්නේ ලී කෙළිය නමැති ක්‍රීඩාව සම්බන්ධව ගෙතුණු කවි ය. ලී කෙළියෙහි ඓතිහාසිකත්වය ගෞතම බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය සාක්ෂාත් කරගත් අවධිය තරම් ඈතට දිවෙන බව

කළ වී රිය බුදු වෙන්නට බෝ මුල
බුදු වී ලොව්තුරු මුනි සඳු බෝ මුල
සෙලවී මිහිකත වෙරගල බඹ තල
පල වී ලී කෙළි එම ආ බෝ මුල

සොබමන් දෙවිවරු සදෙනෙක් එතනට
බහිමින් චාමර ගෙන සැලු සුරතට
නටමින් චාමර සැලුවේ මුනිඳුට
අපි දැන් දක්වමු ඒ රඟ සබයට

(සිංහල ජන සම්මත කාව්‍ය 2011: 107)

යන පද්‍යද්වයෙන් කියැවෙයි. දේවතා නමස්කාරය මෙන් ම ඉරදෙවියන්, සඳ දෙවියන් සහ ගණ දෙවියන් නමස්කාරය ද ලී කෙළි කවිවලින් සිදුවන හෙයින් ලී කෙළි ජන ආගම සමඟ ද ඍජු සබඳතාවක් දක්වන බව පෙනේ.

එක පඳුරෙන් ලී සයක් කපාලා
එක නම ඇති සදෙනෙක් ගෙන්වාලා
ගුරුන් අතට දී ලී බෙදවාලා
අපිත් කෙළිමු ලී දෙපිළ සැදීලා

(සිංහල ජන සම්මත කාව්‍ය 2011: 104)



පූර්වෝක්ත පද්‍යයේ දෙවන පාදයේ දැක්වෙන 'එක නම ඇති සදෙනෙක් ගෙන්වාලා' යන්න වෙනුවට 'එක උස ඇති සදෙනෙක් ගෙන්නා ගෙන' යනුවෙන් යෙදෙන පද්‍යයක් ද වේ (සිංහල ජන සම්මත කාව්‍ය 2011: 103). පූර්වෝක්ත පද්‍යයෙන් ලී කෙළියට අවශ්‍ය ලීවල ස්වභාවය සහ තරඟයට සහභාගී වන පිරිස පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිය. මෙම ක්‍රීඩාව, ජීවත්වීම සඳහා තමනට පිහිට සපයන ගහකොළ විෂයෙහි සාම්ප්‍රදායික සිංහලයින් විසින් දක්වනු ලැබූ කළගුණ සැලකීමක් වශයෙන් ද සැලකීමේ හැකියාව පවතී. ලී කෙළියට යොදාගැනෙන ලී සපයාගත යුතු වූයේ එක ම පඳුරකිනි. එය තරමක දුෂ්කර වූ කාර්යයකි. ඒ දුෂ්කර කාර්යයෙහි නියැලීමේ දී නිරන්තරයෙන් ම ගහ කොළ පිළිබඳ ගෞරවයක්, භක්තියක් සහ ඒවා රැක බලා ගැනීම සම්බන්ධ ආකල්පයක් මිනිසුන් තුළ ගොඩනැගේ. බුදුදහම මෙන් ම වෙනත් දෙවිවරුන් ද කේන්ද්‍ර කොටගත් මේ ක්‍රීඩාව සඳහා ලී සපයන වෘක්ෂයෝ ඉබේම ඔවුන්ගේ වන්දනාමානයට පාත්‍රවෙත්. මේ අනුව කාන්තාවන් සම්බන්ධ සිංහල ජනක්‍රීඩා අතුරින් එකක් වන ලී කෙළිය ආගමික අරමුණු, සාමූහිකත්වය, විනෝදාස්වාදය සහ ස්වභාවධර්මය විෂයෙහි කෘතගුණ සැපයීම කේන්ද්‍රීය වූ ක්‍රීඩාවක් වශයෙන් හඳුන්වාදීමට හැකි ය.

## රබන් කෙළිය

රබාන සිංහල සංස්කෘතියෙහි බහුවිධ කාර්යයන් විෂයෙහි යොදා ගැනුණු භාණ්ඩයකි. සිංහල සංස්කෘතිය තුළ රබානෙහි ක්‍රියාකාරිත්වය පළමුවෙන් ම විද්‍යාමාන වන්නේ සන්නිවේදන මාධ්‍යයක් වශයෙනි; ගැමි දැරියකගේ වැඩිවිය පැමිණීම පිළිබඳ ආරංචිය බොහෝ විට ගමේ පතළ වන්නේ රබන් සුරල් සමඟය. විවාහ මංගල්‍යයක දී මනාල-මනමාලියන්ගේ දෙපාර්ශ්වය ඔවුනොවුන්ගේ නෑයන් සතුටින් පිළිගත් බව අඟවන්නට ද රබාන වාදනය කෙරේ. යම් යම් දෑ පිළිබඳ අසතුට පළකිරීම සඳහා රබන් වාදනය නොකිරීම ද සිදුවේ (රත්නපාල, 1991: 99). ජනජීවිතය සමඟ බද්ධ වූ විවිධ විෂයක තොරතුරු සන්නිවේදනය උදෙසා මුල දී යොදා ගැනුණු රබන් වාදනය පශ්චාත්කාලීනව විනෝදාස්වාදය සැපයෙන ක්‍රීඩාවක් බවට පරිවර්තනය කර ගැනීමට සාම්ප්‍රදායික සිංහලයා සමත් විය.

පළමුව මෙලක තුළ
විජයබා නිරිඳු රජ කළ
විවා බඳිනා කල
රබන් අර්තය රටටවිය මුල
(රත්නපාල 1991: 100)

පූර්වෝක්ත පද්‍යය අනුව මෙරට රබන් වැයීමේ ඉතිහාසයය පොළොන්නරු යුගයෙහි රාජ්‍යත්වයට පත් පළමුවන විජයබාහු රාජ්‍ය සමය දක්වා දිවෙයි. රබන් කෙළිය සඳහා යොදාගැනෙන රබන් වර්ග දෙකක් වෙයි. බංකු රබාන හෙවත් මහ රබාන සහ විරුදු රබානයි (රත්නපාල 1991: 99). මෙම රබන් වර්ග දෙක අතුරින් රබන් කෙළිය සඳහා භාවිතයට ගැනෙන්නේ බංකු රබානයි. එළිමහන් ස්ථානයක සවිකරන ලද ආධාරක (කණු) තුනක් හෝ හතරක් මත රබාන තබා ඊට යටින් ගිනිඅඟුරු ස්වල්පයක් සහිත කබලක් තබා රබාන රත්වන විට ඒ වටේ හිඳගන්නා කාන්තාවෝ සුමධුර පද්‍යවල තාල මතුවන පරිදි අත්ල පාවිච්චි කරමින් මෙම ක්‍රීඩාවෙහි යෙදෙති. ඇතැම් විට පුරුෂ පක්ෂය ද මෙයට සහභාගි වෙති. සුමධුර පද්‍යවල තාල සිහිගන්වන රබන් ක්‍රීඩාව සාමූහිකත්වය වර්ධනය කරවන ක්‍රීඩාවක් මෙන් ම මිනිසුන් තුළ සෞන්දර්ය විඥ්ඥාණය ජනනය කරවන ක්‍රීඩාවක් වශයෙන් ද අගය කළ හැකිය.

## ඔන්චිලි පැදීම

ඔන්චිලි පැදීම අලුත් අවුරුදු සමයේ සිදු කෙරෙන සුලභ ක්‍රීඩාවකි. කතුරු ඔන්චිල්ලා සහ බමර ඔන්චිල්ලා පැදීම යනුවෙන් මෙහි තවත් ප්‍රභේදද්වයක් පැවතිය ද ඒවායෙහි පැවැති ත්‍රාසජනක ස්වභාවය නිසා ඊට සහභාගි වූවෝ පුරුෂ පක්ෂය වූහ. කාන්තාවන් සහ ළමා ළපටියන් එකසේ ප්‍රිය කළ ක්‍රීඩාව වූයේ වැල් ඔන්චිල්ලා පැදීම ය. ගසක සවිබල ඇති අත්තක කඹ දොපොටක් බැඳ, ඒ මත ලෑලි පුවරුවක් බැඳීමෙන් සකස් කෙරෙන ඔන්චිල්ලාව මේ ක්‍රීඩාව සඳහා යොදා ගැනේ. එකම ඔන්චිල්ලාවෙන් ක්‍රීඩා කිරීමට කාන්තාවන් කිහිපදෙනෙකුම ඒකරාශී වන බැවින් තමාගේ වාරය පැමිණෙන තුරු බලා සිටීමට සෑම කාන්තාවකට ම සිදු විය. එමෙන් ම ඔන්චිල්ලාවේ ලෑලි පුවරුව මත වාඩි වූ කාන්තාව පිටුපසින් ඉඳ තල්ලු කිරීමෙන් ඇයට සහයෝගය දැක්වීම ද කළ යුතු විය. ඒ අනුව



මෙය ඉවසීම සහ සහජීවනය ප්‍රගුණ කෙරෙන, සිංහල සංස්කෘතියෙහි අනන්‍යතාව පිළිබිඹු කරවන ක්‍රීඩාවක් වශයෙන් හඳුන්වාදිය හැකිය.

## කළගෙඩි සෙල්ලම

කළගෙඩි සෙල්ලම ක්‍රීඩාවක් වශයෙන් මෙන් ම නර්තනයක් වශයෙන් ද ප්‍රකට ය. මහනුවර සමයේ ආලත්ති ගැහැනුන් සහිත නර්තනය හා ගායනය පිණිස වූ ස්ත්‍රීන් කණ්ඩායමේ ප්‍රියතම ක්‍රීඩාවක් නම් අලුත් කළගෙඩි ගෙන නටන කළගෙඩි නැටුමය (කුමාරස්වාමි 1962: 218). කළගෙඩි සෙල්ලම කිසියම් අභිචාරාත්මක අර්ථයකින් ස්ථාපිත වූවක් බව එහි දී ගැයෙන,

පෙම්මා වඩවන රුසිරට යුත්තු
නිම්මා නැති ඇඳුමුත් ඇඳ ගත්තු
සුම්මා කළගෙඩි දෑතට ගත්තු
අම්මා වරු නැටුමට සිට ගත්තු
(සිංහල මාල කවි සංග්‍රහය 1986: 588)

මෙහි **අම්මාවරු** යන්නෙන් මෙරට ප්‍රකට දේවතාවියක වන පත්තිනිය පිළිබඳ සංකල්පයක් මැවේ. මෙලෙසින් ආගමික පරමාර්ථයක් සහිතව ක්‍රියාත්මක වුව ද කළගෙඩි සෙල්ලමේ දී සිදුවන කළගෙඩි ඉහළට දමා ඇල්ලීම, කරකැවීම, පැද්දීම හා උකුලේ තබා ගෙන ලැසි ගමනේ යෙදීම ආදි චලන ශරීරයට ව්‍යායාමයක් ගෙනදෙනසුලු ය. සාමූහිකත්වය හා සහජීවනය මත ගොඩනැගුණු සිංහල ජන සමාජයෙහි දෛනික ජීවනෝපාය කටයුතු, විනෝදාත්මක කටයුතු මෙන් ම ව්‍යායාම් කේන්ද්‍රීය ක්‍රීඩාවන් ද සිදු කෙරුණේ අන්‍යෝන්‍ය සහසම්බන්ධතා තහවුරු වන ආකාරයෙන් බව කළගෙඩි සෙල්ලම ආශ්‍රයෙන් ද තහවුරු වේ. මීට අමතරව හවරි හැංගීම, පනා හැංගීම වැනි කාන්තාවන්ට ම ආවේණික වූ සිංහල ජනක්‍රීඩා රාශියක් පවතී. ඒවා සියල්ල එකින් එක විග්‍රහ කිරීමට මෙහි දී අවකාශ නොලැබේ.

## කාන්තාවන්ට ආවේණික ජනක්‍රීඩාවල සමාජ හා මානව විද්‍යාත්මක වටිනාකම

සිංහල ජනක්‍රීඩාවන්හි පවත්නා විශේෂත්වය වන්නේ, ඒවා කේන්ද්‍රීයව පුළුල් සාහිත්‍යයක් ගොඩනැගී පැවතීම ය. ජනකවි හා

ජනකතා මෙන් ම වෙනත් සාහිත්‍යාංගයෝ ද ඒ අතර වෙත්. කිසියම් රටක ජනජීවිතය පිළිබඳ ව සිදුකෙරෙන අධ්‍යයනයක දී වඩාත් ඉහළ පිටුබලයක් සැපයෙන්නේ (සම්භාව්‍ය සාහිත්‍යයට වඩා) ජනසාහිත්‍යයෙන් බව සමාජ හා මානවවිද්‍යාඥයන්ගේ සිංහල ජනක්‍රීඩා කේන්ද්‍රීය ජනසාහිත්‍යයෙන් ද සාම්ප්‍රදායික ජනජීවිතය සම්බන්ධ විවිධ විෂයක තොරතුරු රාශියක් අනාවරණය කරගත හැකි ය. ඒ අනුව සාම්ප්‍රදායික සිංහලයන්ගේ ආහාර පාන, ජීවන වෘත්තීන්, සතාසිවුපාවා, ඇඳුම් පැලඳුම්, චාරිත්‍ර වාරිත්‍ර, ආගමික ව්‍යවහාරයන් මෙන් ම සාමූහිකත්වය පිළිබඳ කරුණු මෙම ජනක්‍රීඩා ආශ්‍රිත සාහිත්‍යයේ අන්තර්ගතව තිබේ.

මගට කන්ඩ තණ බත්මුල උයා ගන්න නෑනෝ
පුහුල් සමඟ කැකිරි ඇඹුල උයාගන්න නෑනෝ

(සිංහල ජනසම්මත කාව්‍ය 2011: 22)

යන ඔළිඳ කෙළිය කේන්ද්‍රීය ජනකවියෙන් සිංහලයන්ගේ ආහාරපාන අතර තණහාල්බත්, පුහුල් හා කැකිරි වැනි දෑ පැවති බව අනාවරණය වේ.

කරිවිල සිරිවිල සිරිත්ත කොණ්ඩං
ඇල් හාලේ බත පිරිමින්ටයි

(රත්නපාල 1991: 102)

පූර්වෝක්ත පද්‍යයෙන් ඇල්හාලේ බත් සාම්ප්‍රදායික සිංහලයන් භාවිත කළ බවත් එය කාන්තාවන්ට වඩා පුරුෂයන්ට ආවේණික ආහාරයක් බවත් කියැවේ. එමෙන් ම කරිවිල ද ව්‍යංජනයක් වශයෙන් භාවිතයෙහි පැවති බවත් එම පද්‍යයේ ම සඳහන් වේ.

''උඩින් උඩින් වර පෙත්තප්පු - බිමින් බිමින් වර පෙත්තප්පු
පිට්ටු කන්ඩ වර පෙත්තප්පු''

(රත්නපාල 1991: 103)

රබන් කෙළිය ආශ්‍රිත පූර්වෝක්ත පද්‍යයෙන් සිංහලයාගේ සාම්ප්‍රදායික ආහාර අතර පිට්ටු ද පැවති බව කියැවේ.

''උඩපල ගත්තත් - බිමපල ගත්තත් පුංචි පුංචි ගැට වට්ටක්කා''



'තුං තුඹ ගෙඩි තුන නැන්දට දීපං - තිත්ත කැකිරි දෙක මාමට දීපං'
'තිත්ත තිබ්බටු තෙලෙන් බැද්දත් තිත්තමයි හැම දෙයියනේ'

(රත්නපාල 1991: 106)

යන රබන් කෙළිය ආශ්‍රිත පද්‍යවලින් ද වට්ටක්කා, තුඹ, තිත්ත තිබ්බටු වැනි මෙරට සාම්ප්‍රදායික ආහාර පිළිබඳ ව කියැවේ.

නැන්දලාගෙ කොස් වත්තේ
එක ගෙඩියයි පළ ගත්තේ
ඒක කන්ඩ ලුණු නැත්තේ
නුණු මිනිහා ගම නැත්තේ

(මුවන්දෙණිය 1995: 43)

යන පද්‍යයෙන් අනාවරණය වන්නේ කොස් ද ඒ අතර වූ බවයි.

සාම්ප්‍රදායික සිංහල කාන්තාවන්ගේ දෛනික කටයුතු (වෘත්තීන්) පිළිබඳව ද ජනක්‍රීඩා ආශ්‍රිත සාහිත්‍යයෙහි සඳහන් වේ.

'කොස්වතු කන්දේ කොස් නෙළනා දා වලගිය දෝ මගෙ මේවරයා'

(සිංහල ජන සම්මත කාව්‍ය 2011: 25)

යනුවෙන් ඇරඹෙන මේවර කෙළිය තේමා කර ගත් පද්‍ය පන්තියෙන් මුං නෙළීම, කහ කෙටීම, පොල් ඇඹරීම, දර කැපීම, අල හැරීම, වතුර ඇදීම, අතුගෑම යන දෛනික කාර්යයන්හි කාන්තාවන් නියැලි බව අනාවරණය වේ.

සාම්ප්‍රදායික සිංහල කාන්තාවන්ගේ ඇඳුම්-පැලඳුම් පිළිබඳව ද ජනක්‍රීඩා ආශ්‍රිත සාහිත්‍යයෙන් අධ්‍යයනය කළ හැකි ය.

සේලේ ඇඳලා නෙරිය තියාලා - මිදුලේ සක්මන් කරයි කළු
දහසක් දී ලා වළලු තනා ලා - දෑතේ අතලා බලයි කළු

(සිංහල ජන සම්මත කාව්‍ය 2011:592)

ඔළිඳ කෙළියේ දී ගැයෙන පූර්වෝක්ත පද්‍යයෙන් කාන්තාවකගේ ඇඳුම් පිළිබඳ ව මෙන් ම ඔවුන් පැලඳි වළලු වැනි ආභරණ පිළිබඳ ව ද කියැවේ.

'කැකුළු දෙතන ඔසරියෙන් වසාගෙන
රුකුළු වළලු ගෙන දෑතේ ලාගෙන'
(සිංහල මාල කාව්‍ය සංග්‍රහය 1997: 592)

යන කළගෙඩි සෙල්ලමේ ගැයෙන පද්‍යයේ ද කාන්තා ඇඳුම්-පැලඳුම් පිළිබඳ ව සඳහන් වේ.

මේ ආකාරයට සිංහල ජනජීවිතය හා සබැඳි බොහෝ තොරතුරු ජනක්‍රීඩා ආශ්‍රිත සාහිත්‍යයෙහි ඇතුළත් වන ආකාරය ඒවා සියුම් ව විමර්ශනය කිරීමේ දී හඳුනාගත හැකිය. ඒ හා සමාන්තරව ඔවුන'තර පැවති සහජීවනය පිළිබඳ තොරතුරු ද එම පද්‍යවලින් හඳුනාගත හැකිය. ක්‍රීඩාව යනු තරඟයකි. ඒ ස්වභාවය වර්තමාන ක්‍රීඩාවල මෙන් ම සාම්ප්‍රදායික ක්‍රීඩාවල ද පැවතිණි. එහෙත් සාම්ප්‍රදායික ජනක්‍රීඩාවල, වර්තමාන ක්‍රීඩාවල මෙන් අන්තගාමී තරඟකාරිත්වයක් නොවිණි. 'මම' වෙනුවට ඒවායේ යෙදුණේ 'අපි' යන වචනය යි.

''අප වැනි තරුණඟනෝ අද නැටුව ම
අප මණ දන තුටු වෙනවා නැත නි ම''

'ඔළිඳ කඩන්නට යමු අපි නෑනෝ', 'අපි දුටුවේ නැත මේවරයා', 'අපිත් පදිමු දූන් රන් ඔන්චිල්ලා', දියන් නෑනො පනාවා - අපි නොදිටිමු පනාවා', (සිංහල මාල කවි සංග්‍රහය 1997: 596; සිංහල ජනසම්මත කාව්‍ය 2011: 22, 25; මුවන්දෙණිය 1995: 43, 158). පූර්වෝක්ත යෙදුම් අනුව පැහැදිලි වන්නේ ඔවුන් අතරෙහි පැවැති ආත්මාර්ථකාමිත්වයෙන් තොර වූ සහජීවනය කේන්ද්‍රීය සංකල්පයකි. වර්තමානයේ අතිධාවනකාරී ආර්ථික හා සමාජ රටාවකට අනුගතව සිටින ලාංකිකයන් අතුරින් මෙබඳු ජනක්‍රීඩා වියැකී යාම සාම්ප්‍රදායික සමාජ පසුබිම දෙදරා යාමට ද තුඩුදෙන කරුණක් වශයෙන් හඳුනාගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. නෙස්තුර්හ් එම්., (1981), **මිනිසාගේ සම්භවය**, අනුවාදකඃ රුද්රිගු, ද.වි., ප්‍රගති ප්‍රකාශන මන්දිරයඃ මොස්කව්.
2. **මහාවංශය** - ප්‍රථම භාගය, සිංහල (1928), පරිවර්තකවරුඃ හික්කඩුවේ ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත, කොළඹ.





3. **සිංහලානුවාද සහිත දීපවංශය**, (1970), සම්පාදකඃ කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ.
4. ආරියපාල ඇම්. බී., (1962), **මධ්‍යකාලීන ලංකා සමාජය**, කොළඹ
5. නොක්ස්, රොබට් (2008), **එදා හෙළ දිව**, සිංහලානුවාදකඃ ඩේවිඩ් කරුණාරත්න, ගුණසේන, කොළඹ.
6. **Journal of Royal Asiatic Society** of Ceylon Branch, (1873), The Sports and Grames of the Sinhalese (පරිශීලිත පිටපතෙහි මුල් පිටු කිහිපය අස්ථානගතව තිබූ හෙයින් මුද්‍රණය හා ප්‍රකාශනය පිළිබඳ විස්තර නොදැක්විණි.)
7. **ඇම්. බී. ආරියපාල උපහාර අංකය** (වර්ෂය නොදැක්වේ), සංස්කාරකවරුඃ ජී. හේමපාල විජයවර්ධන, ජේ. බී. දිසානායක ඇතුළු පිරිස, කොළඹ විශ්වවිද්‍යාලය.
8. **සිංහල ජන සම්මත කාව්‍ය**, (2011), හතරවන මුද්‍රණය - සංස්කාරකවරුඃ ඩබ්ලිව්. ආතර් ද සිල්වා සහ ගුණපාල මලලසේකර, ගොඩගේඃ කොළඹ.
9. සෝරත හිමි වැලිවිටියේ, (1999), **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය** ද්විතීය භාගය, ගොඩගේඃ කොළඹ.
10 රත්නපාල, ඊ. ඇම්., (1991), **ජනජීවිතය ජනශ්‍රැතිය හා රයිගම**, ගොඩගේඃ කොළඹ.
11. මුවන්දෙණිය, රෝහිණී කුමාරි, (1995), **හෙළ ජන කෙළි සෙල්ලම්**, වැල්ලම්පිටිය.
12. **සිංහල මාල කවි සංග්‍රහය**, (1997), සම්පාදකඃ තෙරිපැහැ සෝමානන්ද හිමි, යුනෙස්කෝ ජාතික මණ්ඩලය - ඉසුරුපායඃ බත්තරමුල්ල.
13. කුමාරස්වාමි ආනන්ද, (1962), **මධ්‍යකාලීන සිංහල කලා**, පරිවර්තකඃ එච්. එම්. සෝමරත්න, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවඃ කොළඹ.